# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## உள்நாட்டு இறைவரித் திணைக்களம்
## DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawath
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 2135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


මුද්දර ගාස්තු චක්‍රලේඛ ලිපි : SEC/2019/02

2019 මැයි මස 14 වන දින

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්

**2008 අංක 10 දරන මුද්දර ගාස්තු ( විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 2006 අංක 12 දරන මුද්දර ගාස්තු ( විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සහ නියෝග ප්‍රකාර, මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් මත හිඟ මුද්දර ගාස්තු අය කර එකතුකර ගෙවීම.**

මා අමතන ලද විගණකාධිපතිගේ අංක PUR/D/IR/3/AQ/18/01 දරන 2018.01.16 වන දිනැති විගණන විමසුමෙන්,

1) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FP/06/10/02/03 දරන 2008.04.30 දිනැති ලිපිය මගින්, කරන ලද දැන්වීම පරිදි, සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් අමතන ලද දේශීය ආදායම් කොමසාරිස් - විමර්ශන, නීති හා මුද්දර බදු ගේ 2008.05.03 දිනැති මුද්දර බදු චක්‍රලේඛ අංක 2008 / 02 මගින් කරන ලද දැන්වීම සහ

2) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක FP/06/10/01/04 දරන 2017.01.10 වන දිනැති "දේශීය මත්පැන් විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වන මුද්දර ගාස්තුව" ශීර්ෂය දරන ලිපියෙන් කරන ලද දැන්වීම පරිදි සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් අමතන ලද දේශීය ආදායම් කොමසාරිස් - මුද්දර ගාස්තු ගේ 2017.02.27 වන දිනැති අංක මුද්දර ගාස්තු 2017 / 01 දරන ලිපිය, මගින් කරන ලද දැන්වීම

අනුව, මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීමේ යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු පැවැති නීතියට පටහැනි ආකාරයට අය නොකිරීමෙන් ආණ්ඩුවට අහිමි වූ මුද්දර ගාස්තු ආදායම නියැදි පරීක්ෂාවක් මගින් පෙන්වා දී ඇත.

2.1) යම් ලිත් වර්ෂයක් සඳහා නිකුත් කරන ලද විදේශ මත්පැන් විකිණීමේ බලපත්‍රයක්, යම් ලිත් වර්ෂයක් තුළ වර්ෂයකට අඩු කාලයක් සඳහා යම් ස්ථානයක පවත්වාගෙන යන මත්පැන් වෙළෙඳසැලකට නිකුත් කරනු ලැබූ බලපත්‍රය වරින්වර දීර්ඝ කිරීමේ යම් බලපත්‍රයක්, යම් රටබීම විකිණීමේ බලපත්‍රයක් සමග දේශීය මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද යම් අරක්කු බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු,

(i) 2006.04.03 වන දින අංක 1439/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ, 2006.04.04 වන දින සිට 2006.10.05 වන දින දක්වා බලාත්මක වූ නියෝගය හා එහි උපලේඛනයේ 4 වන අයිතමයට අනුකූලව 2006.04.04 වන දින සිට 2006.10.05 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ රු.1,000/- ක්ද,

(ii) 2006.10.05 වන දින අංක 1465/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ, 2006.10.06 වන දින සිට 2007.12.31 වන දින දක්වා බලාත්මක වූ නියෝගය හා එහි උපලේඛනයේ 4 වන අයිතමයට අනුකූලව 2006.10.06 වන දින සිට 2007.12.31 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ රු.1000.00 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන අගයන් දෙකෙන් අඩු මුදලද,

(iii) 2008.01.01 වන දින අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ, 2008.01.01 වන දින සිට 2012.12.31 වන දින දක්වා බලාත්මක වූ නියෝගය හා එහි උපලේඛනයේ 4 (ආ) වන අයිතමයට අනුකූලව 2008.01.01 වන දින සිට 2012.12.31 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ රු.10,000 ක්ද,

අයකර එකතු කර ගෙවිය යුතුව තිබුණි.

2.2) 2012.12.17 වන දින අංක 1789/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ, 2013.01.01 වන දින සිට 2018.09.30 වන දින දක්වා බලාත්මක වූ නියෝගය හා එහි උපලේඛනයේ 4 වන අයිතමයට අනුකූලව 2013.01.01 වන දින සිට 2018.09.30 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ, යම් ලිත් වර්ෂයක් සඳහා නිකුත් කරන ලද විදේශ මත්පැන් විකිණීමේ බලපත්‍රයක්, යම් ලිත් වර්ෂයක් තුළ වර්ෂයකට අඩු කාලයක් සඳහා යම් ස්ථානයක පවත්වාගෙන යන මත්පැන් වෙළෙඳසැලකට නිකුත් කරනු ලැබූ බලපත්‍රය වරින්වර දීර්ඝ කිරීම නව බලපත්‍රයක් නිකුත් කිරීම නිසා එකී යම් බලපත්‍රයක්, යම් රටබීම විකිණීමේ බලපත්‍රයක් සමග දේශීය මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද AFL 1, AFL 2, AFL 3 හා AFL 4 යන අරක්කු බලපත්‍ර අතුරින් යම් අරක්කු බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු රුපියල් 20,000/- ක් අයකර ගෙවිය යුතුව තිබුනි.

3) ඉහත 01 හා 02 ඡේදවල සඳහන් කරුණු සම්බන්ධව අවධානය යොමුකොට, ඒ අනුව යම් මත්පැන් විකිණීමේ බලපත්‍රයක් හෝ යම් බෝතල් රා විකිණීමේ බලපත්‍රයක් මත අයකර එකතු කර ගෙවිය යුතුව තිබූ නමුත් නිසි ආකාරයට අයකර එකතු කර ගෙවා නැති මුද්දර ගාස්තු, අයකර එකතුකර ගෙවීමට කඩිනම් පියවර ගන්නා ලෙසත්, එසේ අය කරන ලද මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නමින් අණ කරන ලද චෙක්පතක් මගින්, මෙයට අමුණා ඇති මුද්දර ගාස්තු ප්‍රේෂණ පත්‍රයේ පසු පිටේ සඳහන් උපදෙස් අනුගමනය කරමින්, ප්‍රේෂණ පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, ලංකා බැංකුවේ අංක : 4153842 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ මුද්දර ගාස්තු ගිණුමට 2019.06.15 වන දින හෝ එදිනට පෙර ප්‍රේෂණය කරන ලෙසත්, එකී ප්‍රේෂණ පත්‍රයේ සහතික කරන ලද ඡායාස්ථ පිටපතක් සහ මෙයට අමුණා ඇති ආකෘතියට අනුකූලව සකස් කරන ලද හිඟ මුද්දර ගාස්තු අයකර එකතු කර ගෙවීම සම්බන්ධව තොරතුරු ඇතුලත් ප්‍රකාශනය නිසි ලෙස සම්පූර්ණ කර, ප්‍රාදේශීය ලේකම්ගේ හා ගණකාධිකාරීගේ අත්සනින් 2019.06.15 වන දින හෝ එදිනට පෙර ලැබෙන සේ, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, මුද්දර ගාස්තු අංශය, 11 වන මහල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙසත්, ඉතා කාරුණිකව දන්වමි.

4) 2018 ඔක්තෝබර් මස 01 වන දින අංක 2091/3 හා 2018 දෙසැම්බර් මස 31 වන දින අංක 2104/5 දරන අති විශේෂ ගැසට් පත්‍ර මගින් කරන ලද නියෝගයන් හා උපලේඛන 4 (ආ) වන අයිතමයට අනුකූලව 2018 ඔක්තෝබර් මස 01 වන දින හෝ එදිනට පසුව නිකුත් කරනු ලබන මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ බෝතල් රා විකිණීමේ යම් බලපත්‍රයක් මත මුද්දර ගාස්තු අයකල යුතු බව ඉතා කාරුණිකව දන්වමි.

නදුන් ගුරුගේ
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත
කොළඹ 02.

නදුන් ගුරුගේ
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

පිටපත් :
1. විගණකාධිපති සහ ජාතික විගණන කොමිෂන් සභාවේ සභාපති
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සුරාබදු කොමසාරිස් ජනරාල්
4. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය